සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය


**12 ශ්‍රේණිය** | **යුරෝපා ඉතිහාසය** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (5) | 02. (5) | 03. (3) | 04. (5) | 05. (2) | 06. (5) | 07. (3) | 08. (1) | 09. (4) | 10. (2) |
| 11. (2) | 12. (3) | 13. (4) | 14. (5) | 15. (5) | 16. (5) | 17. (5) | 18. (1) | 19. (5) | 20. (5) |
| 21. (3) | 22. (2) | 23. (1) | 24. (3) | 25. (1) | 26. (5) | 27. (1) | 28. (5) | 29. (2) | 30. (5) |
| 31. (3) | 32. (2) | 33. (3) | 34. (4) | 35. (5) | 36. (5) | 37. (3) | 38. (1) | 39. (3) | 40. (1) |

## II කොටස

01




02. (1) දේශපාලන ක්‍රමය

- ★ ප්‍රධාන පුරවැසියන්ගෙන් සැදුම්ලත් සමූහාණ්ඩුවක් ලෙස පාලන කටයුතු ඇරඹීම හා සෙනෙට් සභාවක් තෝරා පත් කර ගැනීම.
- ★ සෙනෙට් සභාවේ මුලසුන දැරූ තැනැත්තා ප්‍රථමයා ලෙස හඳුන්වා ඇති අතර පසුව අධිරාජ්‍යයා ලෙස නම් කොට ඔහුට දේවත්වය ආරූඪ කොට ඇත.
- ★ රෝම සමූහාණ්ඩුව තුළ කොන්සල්වරු යනුවෙන් හැඳින්වූ නිලධාරීන් දෙදෙනෙකුට මුල්තැන ලැබුණි.
- ★ පුළුල් අධිරාජ්‍යයක් ගොඩනැගූ අතර අධිරාජ්‍ය තුළ වාසය කළ ජන කොටස් සඳහා සාමය, සමාදානය සහතික වන ප්‍රාදේශීය හා පළාත් පාලන ක්‍රමයක් මෙන්ම නීති පද්ධතියක් විය. (ජස්ටීනියන් අධිරාජ්‍යයාගේ නීති පද්ධතිය)

(2) කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය

- ★ පොදු ගොඩනැගිලි ඉදි කිරීම රෝම ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂත්වයකි.
- ★ විශාල ගොඩනැගිලි, ආරුක්කු හා ගෝලාකාර ශීඛරය මෙන්ම වඩාත් සැපපහසු ගොඩනැගිලි ඉදි කිරීම විශේෂ ලක්ෂණයකි.
  උදා: කොලෝසියම්, ඩයොක්ලිෂන් අධිරාජ්‍යයාගේ මාලිගය, බැසිලිකා ගොඩනැගිලි.
- ★ ලතින් භාෂාව භාෂා මාධ්‍ය විය.
- ★ වර්ණ භාවිතය, චිත්‍ර සඳහා උචිත ආලෝකය යෙදීමේ දක්ෂතාවය, මැටි බඳුන්, ඔගස්ටස් අධිරාජ්‍යයාගේ ප්‍රතිමා

(3) දර්ශනය

- ★ සංවිධානාත්මක ආගමක් නොතිබුණ අතර ස්වභාවික වස්තූන්ට වන්දනාමාන කරන ලදී.
- ★ ජුපිටර් අහසට අධිපති
- ★ මිනර්වා අත්කම්වලට අධිපති
- ★ මාර්ස් යුද්ධයට අධිපති
- ★ සෙරෙස් අස්වැන්නට අධිපති
- ★ වීනස් ආලයට අධිපති
- ★ නෙප්චූන් මුහුදට අධිපති

භූතාත්ම වලට වන්දනාමාන කිරීම.

මව් දෙවඟනට පුද පූජා පැවැත්වීම.

විද්‍යාව හා තාක්ෂණවේදය

- ★ සෞඛ්‍ය පිළිබඳව සැලකිලිමත් වූ රෝමවරු නාන තටාක ඉදිකරන ලදී.
- ★ ජල ප්‍රවාහන පද්ධති ක්‍රමානුකූලව ඉදි කරන ලදී.
- ★ නේවාසික රෝහල් ක්‍රමයක් ද ක්‍රියාත්මක කරන ලදී.
- ★ ගැලන් නම් වූ වෛද්‍යවරයා මනුෂ්‍ය ශරීරයේ අවයව වල ප්‍රයෝජන හා ක්‍රියාකාරීත්වය දක්වා ඇත.
- ★ ප්ලිනි ස්වාභාවික ඉතිහාසය සම්පාදනය කිරීම.
- ★ සොෆිගිනස් දින දර්ශනය

03. (1) ඉතාලිය

(2) 15 හා 16 වන සියවස්වල කලාව, සාහිත්‍ය, විද්‍යාව, ආගම, දේශගවේෂණය යනාදි සියලුම අංශවල ඇති වූ නව ප්‍රබෝධය පුනරුදය නම් වේ. කොන්ස්තන්තිනෝපලය ඉස්ලාම් භක්තිකයන්ට යටත් වීම නිසා එහි තිබූ පොත්පත් යුරෝපයට රැගෙන යාම නිසා ග්‍රීක රෝම කලාව හා සාහිත්‍ය සංස්කෘතිය යළි ප්‍රබෝධයට පත් විය.

(3) ලෞකික රසවින්දනය ඉස්මතු විය. ග්‍රීක රෝම කලාවන් ජනප්‍රිය විය. ස්වභාවිකත්වයට අවධානයට යොමු කරමින් කලව, සාහිත්‍ය දියුණු විය.

චිත්‍ර කලාව පිළිබඳව මොනාලිසා, අවසාන රාත්‍රී භෝජන සංග්‍රහය ඩේවිඩ් වැනි මූර්ති ශිල්පීන්

ලියනාඩෝ ඩාවින්චි, මයිකල් ආන්ජලෝ බොට්ටිශෙල්ලි, ඩොනටෙලෝ, රෆායල් වැනි චිත්‍ර ශිල්පීන්ගේ දායකත්වය

ග්‍රීක ලතින් භාෂාව පිළිබඳව විශාල ප්‍රබෝධයක් ඇති විය. මානවවාදය ඇති විය. පුනරුද යුගයේ ලේඛකයින් රැසක් බිහි විය. විලියම් ශේක්ස්පියර්, පෙට්රාක්, මැකියාවෙලිගේ රාජ කුමාරයා ග්‍රන්ථය ද නිදසුනකි.

04. (1)
- ★ අධික ජනගහනය
- ★ විදේශ වෙළඳාම පුළුල් වීම නිසා ධනවතුන් ඇති වීම.
- ★ අතිරික්ත ධනය තැන්පත් කළ හැකි ධනවතුන් සිටීම.
- ★ භාණ්ඩවලට ඇති ඉල්ලුම වැඩි වීම.
- ★ යටත්විජිත වලින් අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකි වීම.
- ★ විද්‍යාත්මක ඥානය හා දැනුම දියුණු වී තිබීම.

(2) දුවන නඩාව, ස්පිනිං ජෙනි, ජල රාමුව, වාෂ්ප එන්ජිම, සිපිනිං මියුල් පේෂ කර්මාන්තය

යකඩ හා වානේ

- ★ බෙසමර්ගේ යකඩ නිපදවීමේ ක්‍රමය 1856
- ★ ඒබ්‍රහම් ඩාර්බිගේ යපස් උණු කිරීමට ගල් අඟුරු යොදාගැනීමේ තාක්ෂණය
- ★ වාෂ්ප එන්ජිම
- ★ ජේම්ස් වොට් වාෂ්ප එන්ජිම වැඩි දියුණු කිරීම.
- ★ හම්ප්‍රි ඩේවි ආරක්ෂිත පහන

(3)
- ★ මධ්‍යකාලීන යුරෝපය නූතන යුරෝපය බවට පත් වීම. කෘෂිකර්මාන්තය මත පැවති ආර්ථික ක්‍රමය වෙනුවට කර්මාන්ත මත පදනම් වූ ආර්ථික ක්‍රමයක් ගොඩ නැගීම
- ★ ඒකාධිකාරී වෙළඳපොළ
- ★ නාගරීකරණය වන සමාජය
- ★ ධනේශ්වර පන්තිය බලවත් වීම.
- ★ කම්කරු පන්ති බිහි වීම හා පන්ති අරගලය විස්තර කර තිබිය යුතුය.

05. නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.